හලාවත නගර සභාව - 2023
--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හලාවත නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හලාවත නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි

හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.1,499,900ක් වූ ස්ථාවර වත්කම් 09ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2024 අවසන් ගිණුමෙන් ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු අයි වෙන්කිරීම් වටිනාකම වූ රු.2,027,409ක් ගිණුම්වලට ගැළපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 06කට අදාළව මූල්‍ය ප්‍රකාශන සහ උපලේඛනවල ශේෂ අතර රු.6,939,268ක වෙනසක් විය. | වෙනස්කම් 2024 වසරේ අවසන් ගිණුම් සකස් කිරිමේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව. | ලේඛන නිවැරදි කර නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.339,468,688ක් වූ ගිණුම් විෂයයන් 07ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | 2024 අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම්වලට අදාළ උප ලේඛන ගිණුම සමඟ ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම. | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මු.රෙ. 571(2) | වර්ෂ 02ක් ඉකුත් වූ පොදු තැන්පත් සම්බන්ධයෙන් මුදල් | 2024 අවසන් ගිණුමෙන් ගැළපීම් | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කිරීමට කටයුතු කරන බව. | |
| (ආ) නගර සහා ආඥා පනත 170 වගන්තිය | වර්ෂ 01කට වැඩි කාලයක සිට හිඟව ඇති වරිපනම් බදු හා හිඟ බදු කුලී සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | දේපළ තහනම් කිරීමක් සිදු නොකළ අතර හිඟ එකතු කිරීමේ කටයුතු සිදු කරන ලද බව. | නගර සභා ආඥා පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝග හා 1978 ජූනි 07 දිනැති අංක 320/8 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද සංශෝධනය පළාත් පාලන විශ්‍රාම වැටුප් නියෝග 36 වෙනි වගන්තිය | නිසි ලෙස මාසිකව විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවා නොතිබුණි. | තොරතුරු ලැබීමෙන් අනතුරුව හිඟ මුදල ගෙවීමට කටයුතු කරන බව. | ගැසට් පත්‍රය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.49,142,527ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමරු.10,554,339ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 23,782 | 23,624 | 11,866 | 53,018 | 23,688 | 23,479 | 12,861 | 51,260 |
| කුලී | 43,837 | 50,073 | 29,882 | 44,039 | 45,631 | 41,638 | 35,836 | 47,957 |
| බලපත්‍ර ගාස්තු | 395 | 315 | 315 | - | 1,406 | 15,441 | 15,441 | - |
| වෙනත් ආදායම් | 16,553 | 25,901 | 24,403 | 292 | 3,454 | 10,126 | 5,710 | - |
| එකතුව | 84,567 | 99,913 | 66,466 | 97,349 | 74,179 | 90,684 | 69,848 | 99,217 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු. 53,018,564ක්, සහ කුලී රු. 45,056,428ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.70,541,829ක් වූ මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි. ඉන් වර්ෂ 01ට අඩු මුද්දර ගාස්තු රු.28,669,800ක්ද වර්ෂ 01ට වැඩි වර්ෂ 03ට අඩු රු.41,872,029ක්ද වශයෙන් හිඟ ශේෂ දක්නට ලැබුණි. | 2024 අවසන් ගිණුමෙන් ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ඔක්තෝබර් 01 දින රු.27,500කට මිලදීගෙන හලාවත පොදු වෙළඳපලේ පොදු වැසිකිළියේ සවිකර තිබූ ජල පොම්පය 2022 ජූලි 11 දින අස්ථානගත වීම සම්බන්ධයෙන් එම දිනයේ ම පොලිසියට පැමිණිලි කර ප්‍රාරම්භක වාර්තා හා අවසන් වාර්තා ගොනු කර තිබුණද මේ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කමිටුවට යොමු කර ඉදිරි කටයුතු සිදුකරන බව. | අවසාන වාර්තාවෙන් පසු මුදල් රෙගුලාසිවල දක්වා ඇති පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ කොහා මෘදුකාංගය සමඟ උපකරණ 08ක් ලබා දී මේ වන විට අක්‍රීය වී වසර 6ක් ගතවී තිබූ අතර යථා තත්ත්වයට පත් කරගෙන නොතිබුණි. | දුන්කන්නාව මහජන පුස්තකාලයේ මෙම මෘදුකාංගය ක්‍රියාත්මක කරන බැවින් එම පුස්තකාලයෙන් උපදෙස් ලබාගෙන කටයුතු කරන බව. | මෘදුකාංගය සක්‍රීය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ගිණුම්වල වටිනාකම රු.259,977,260ක් විය. එය තුල වූ වර්ෂ 03ක් ඉක්මවූ ශේෂවල වටිනාකම රු.125,949,156ක් වූ අතර මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීම සඳහා කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.42,753,233ක් වූ අතර එය තුල වූ වර්ෂ | 2024 අවසන් ගිණුම් සැකසීමේදී නිරවුල්කර ගැනීමට කටයුතු කරන බව. | ණයහිමි ශේෂ කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය. |

03ක් ඉක්මවූ ශේෂවල වටිනාකම රු.15,269,396ක් විය.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේදී ශර්ලි කොරයා ශාලාව හලාවත රෝහල වෙත ලබා දී තිබුණද ගිවිසුමකට එළඹ නොතිබූ අතර 2023 වර්ෂය වන විටත් එය සභාව වෙත ආපසු ලබාගෙන නොතිබුණි. 2017 වර්ෂයේ සිට 2023 මැයි 31 දක්වා හිඟ කුලී මුදල වන රු.3,646,100ක් විය. | ගිවිසුම්ගත වීමට එකඟතාවය පලකර ඇති බැවින් ඒ සඳහා අනුමැතිය සහ උපදෙස් පළාත් පාලන කොමසාරිස් තුමා වෙතින් ඉල්ලා ඇති බව. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් 2020 මාර්තු මස කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් සඳහා විලව් මේරියන්ස් ශෘහස්ථ ක්‍රීඩාංගන ගොඩනැගිල්ල හලාවත රෝහල වෙත ලබා දී වසර 03කට අධික කාලයක් ගත වී තිබූ අතර එය නැවත ලබා ගැනීමට හෝ ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. | ප.පා.කොමසාරිස්තුමාගේ උපදෙස් හා අනුමැතියට යොමුකර ඇති ලිපියට ලැබෙන නිර්දේශ හා අනුමැතිය මත ගිවිසුම්ගත වීමට නියමිත බව. | ගොඩනැගිල්ල සභාව වෙත නැවත ලබා ගැනීමට හෝ විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ රු.2,842,210ක් වැයකර සවිකරන ලද වායු සමීකරණ යන්ත්‍ර 21න් 07ක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් විදුලිබල ධාරිතාවක් නොමැති වීම හේතුවෙන් රු.692,337ක් වටිනා යන්ත්‍ර 07ක් නිෂ්කාර්යව පැවතුණි. | පම්බල, කාක්කපල්ලිය විගණන උප කාර්යාලය මගින් කළ ඉල්ලීමට අනුව එම යන්ත්‍ර ලබාදීමට අවශ්‍ය උපදෙස් ඉල්ලා ඇති අතර ඒ සඳහා ලැබෙන විසඳුම් මත කටයුතු කිරීමට නියමිත බව. | සභා අරමුදල් වැය කර මිලදී ගන්නා ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ ඇති සභාව විසින් භුක්ති විඳිනු ලබන ඉඩම්, ක්‍රීඩාපිටි හා සුසානභූමි ඉඩම් 38ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේවන විට ඉඩම් 09 අදාල පෙරසවි ගාස්තු ගෙවා පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | අදාළ දේපළවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 දෙසැම්බර් 02 දින ඉදිකර අවසන් කරන ලද නව වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල වර්ෂ කිහිපයක් ගත වීමෙන් පසු පළමු මහලෙහි කොන්ක්‍රීට් පුවරුවෙහි කම්බි මතු වී දිරාපත්ව අනාරක්ෂිත තත්ත්වයේ පැවතීම, පළමු මහලෙහි කොන්ක්‍රීට් පුවරුවෙන් ජලය කාන්දු වීම, පළමු මහලේ කොන්ක්‍රීට් කණු සහ තලාදවල කම්බි මතු වී දිරාපත් වීම හා පළමු මහලේ සිවිලිම ගැළවීම වැනි ඉදිකිරීම් ගුණත්වයේ දෝෂ හේතුවෙන් ගොඩනැගිල්ලෙහි දෙවන මහළ ඉදිකිරීමට නොහැකිව වැය කරන ලද රු.62,344,280ක් වූ මුළු මුදලම නිශ්කාර්ය වී තිබුණි. | රු.62,344,280ක් වැය කර 2019/12/10 දින ඉදිකර අවසන් කළ දිනය නිවැරදි නොවන බවත් එම ගොඩනැගිල්ලේ වැඩ නිම කර හලාවත නගර සභාවට භාර දුන් දිනය 2008/12/02 වන බවත් දන්වා සිටින බව. | අදාළ නිලධාරීන්ගේ සුපරීක්ෂණය මත ඉදිකිරීම් නියමිත තත්ත්වයෙන් හා ගුණත්වයෙන් යුතුව සිදු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ විධායක ශ්‍රේණියේ එක් තනතුරක ඌනතාවයක්ද, තෘතියික ශ්‍රේණියේ තනතුරු 01ක අතිරික්තයක් හා ඌනතාවයක්ද, ද්වීතියික ශ්‍රේණියේ තනතුරුවලට අයත් සේවකයින් 42ක ඌනතාවයක් හා සේවකයින් 11ක අතිරික්තයක්ද, ප්‍රාථමික ශ්‍රේණියට අයත් තනතුරුවල සේවකයින් 78ක ඌනතාවයක් ද විය. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව බඳවාගැනීම් නතර කර ඇති බව. | සභාවට අවශ්‍ය සේවක ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන එම සේවක ප්‍රමාණය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.7 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 සැප්තැම්බර් 30 දින අපහරණය කිරීමට යෝජිතව තක්සේරු කරන ලද වාහන 05ක තක්සේරු වාර්තාව පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට ඉදිරිපත් කර ඇතත් මෙතෙක් අනුමැතිය ලැබී නොතිබුණි. | තක්සේරු කමිටුවේ කටයුතු සිදු වී නොමැති බව. | කඩිනමින් වාහන තක්සේරු කර අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 20ක් ඉටු කිරීම සඳහා රු.6,269,066ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | රාජ්‍ය වියදම් පාලනය කිරිමේ චක්‍රලේඛයට අනුව වියදම් පාලනය කිරිමට සිදු වූ බැවින් අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට නොහැකි වූ බව. | සියළු අංශ ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සිදු කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අභ්‍යන්තර විගණනය විසින් කර්මාන්ත පරීක්ෂාව, පුස්තකාල පරීක්ෂාව, වීථිපහන් සවි කිරීම් හා ස්ථාවර වත්කම් ලේඛනගත කිරීම දීර්ඝ කාලයක් තිස්සේ පවතින ලැබිය යුතු ශේෂ හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම වැනි ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | 2024 වර්ෂයේ අභ්‍යන්තර විගණනය ශක්තිමක් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | ආයතනයේ සියළුම කටයුතු ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය. |

### 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තාත්වික හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 25ක් සඳහා සලසාගෙන තිබුණු රු. 2,337,000ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනද වැය විෂයයන් 25ක් සඳහා සලසාගෙන තිබුණු රු.33,062,380ක් වූ ප්‍රතිපාදිත මුදලින් සියයට 50 සිට සියයට 98 දක්වා පරාසයක ඉතිරිවීම්ද පැවතුණි. | ව්‍යාපෘති අයවැයක් පිළියෙල කරන බැවින් එක් එක් ව්‍යාපෘතියේ වැය ශිර්ෂ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන බව සහ රාජ්‍ය වියදම් පාලනය කිරිමේ චක්‍රලේඛයට අනුව වියදම් පාලනය කිරිමට සිදු වූ බැවින් අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට නොහැකි වූ බව. | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය. |

### 4.4 තිරසාර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 13ක් හඳුනාගෙන එම අරමුණු ළඟා කර ගැනීමේ ක්‍රියාකාරකම් 66ක් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එම ක්‍රියාකාරකම් අතුරින් 25ක් සම්පූර්ණයෙන් ඉටුකර නොතිබූ අතර ක්‍රියාකාරකම් 41ක ප්‍රගතිය සියයට 05 සිට සියයට 98 දක්වා පරාසයක පැවතුණි. | රාජ්‍ය වියදම් පාලනය කිරිමේ චක්‍රලේඛයට අනුව වියදම් පාලනය කිරිමට සිදු වූ බැවින් අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට නොහැකි වූ බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කවලට ළඟාවීමට කටයුතු කළ යුතුය. |